# තුර්කි ජාතික දිනය කුලීගොඩ දී හෙට සැමරේ

ලෝකයේ විවිධ රටවල හා ශ්‍රී ලාංකික ජනතාව අතර මිත්‍රත්වය සහ අවබෝධය ඇතිකරලීමේ අරමුණින් ශ්‍රී ලංකා - එක්සත් ජාතීන්ගේ මිත්‍රත්ව සංවිධානය (සත්ෆෝ) මගින් පවත්වන තුර්කි ජන රජයේ ජාතික දින උත්සවය හෙට 31 වැනිදා ශ්‍රී ලංකාවේදී පැවැත්වේ. එය එදින ප. ව. 2.30 සිට 5.30 දක්වා ගලගොඩ, අම්බලන්ගොඩ, කුලීගොඩ විද්‍යාලයේ දී උත්සවාකාරයෙන් සිදු කෙරේ.

ශ්‍රී ලංකා සහ තුර්කි ජනරජයේ ජාතික කොඩි ඔසවා ජාතික ගී ගායනයෙන් ඇරඹෙන මෙම උත්සවයේදී සංස්කෘතික සංදර්ශනයක් සහ තිබත්ධන තරගයක් ද පැවැත්වීමට කටයුතු යොදා ඇත.